125
වෙනි සංවත්සරය

1898

# කොළඹ තරුණ බෞද්ධ සංගමය

**(පාර්ලිමේන්තු පනතකින් අනුමත කරන ලද ව්‍යවස්ථාපිත පුණ්‍යායතනයකි)**

2024.01.01

ගරුතර ස්වාමින්වහන්ස/මහත්මයාණෙනි/මහත්මියනි,

කොළඹ තරුණ බෞද්ධ සංගමය වාර්ෂිකව පවත්වන සමස්ත ලංකා ගද්‍ය - පද්‍ය රචනා, ගායනා, චිත්‍ර හා කථික තරග 2024 වර්ෂයේදීත් පැවැත්වීමට කටයුතු සම්පාදනය කර ඇත. ශ්‍රී ලාංකික තරුණ පරපුර තුළ බුදු දහම, බෞද්ධ සංස්කෘතිය හා සිංහල සාහිත්‍යය පිළිබඳ අවබෝධය ද රසඥතාව හා ගායනා කුසලතාව, කථිකත්වය හා නිර්මාණශීලීත්වය වර්ධනය කිරීම ද එම තරග වල අරමුණ වේ. එම තරගාවලිය දීප ව්‍යාප්තව දහම් පාසල් හා පාසල් දරු දැරියන් සඳහා ද දහම් පාසල් ගුරුවරුන් සඳහා ද සංවිධානය කරනු ඇත. පාසල් සහ දහම් පාසල් දරුවන්ගේ තරග සඳහා නියමිත වයස ඒ ඒ තරගවලට අදාලව දක්වා ඇති පරිදි 2024.01.01 දිනට සම්පූර්ණ වී තිබිය යුතුය. **(සංවිධාන කටයුතු ක්‍රමවත්ව සිදු කිරීම සඳහා නිසි උපදෙස් අනුව අයදුම්පත් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කිරීමට කටයුතු කරන්න.)**

## ගද්‍ය රචනා තරග

### පළමුවැනි කාණ්ඩය

කනිෂ්ඨ තරගය - වයස අවුරුදු 15 දක්වා වූ දහම් පාසල් හා පාසල් දරු දැරියන් සඳහා ය. මෙම තරගය සඳහා වචන 300 - 400 අතර ගද්‍ය රචනාවක් පහත සඳහන් මාතෘකාව යටතේ ලිවිය යුතුය.

- පළමු කාණ්ඩය සඳහා රචනා මාතෘකාව
  **"මා දහම් පාසල් යන්නේ හොඳ බොදු දරුවෙකු වීමටයි"**

### දෙවැනි කාණ්ඩය

ජ්‍යෙෂ්ඨ තරගය - වයස අවුරුදු 15 - 19 අතර දහම් පාසල් හා පාසල් දරු දැරියන් සඳහා ය. මෙම තරගය සඳහා වචන 500 - 600 අතර ගද්‍ය රචනාවක් පහත සඳහන් මාතෘකාව යටතේ ලිවිය යුතුවේ.

- දෙවැනි කාණ්ඩය සඳහා රචනා මාතෘකාව
  **"තරුණ ජිවිත හොඳින් කළමණාකරනය කර ගැන්මට බෞද්ධ ධර්මය ඉවහල් කර ගනිමු"**

### තෙවැනි කාණ්ඩය

දහම් පාසල් ගුරුභවතුන් සඳහා ය. මෙම තරගය සඳහා වචන 1000 ක පමණ ගද්‍ය රචනාවක් පහත සඳහන් මාතෘකාව යටතේ ලිවිය යුතුවේ.

- තෙවැනි කාණ්ඩය සඳහා රචනා මාතෘකාව
  **"ත්‍රිපිටකාගත බුද්ධ ධර්මය විකෘති කිරීමට ඉඩ නොදිය යුතුය"**

### සිව්වැනි කාණ්ඩය

## පද්‍ය රචනා තරගය

වයස අවුරුදු 12 - 19 අතර දහම් පාසල් හා පාසල් දරු දැරියන් සඳහා ය.
පහත සඳහන් මාතෘකාව මුල් කරගෙන පද්‍ය පහක (5) නිර්මාණයක් එවිය යුතුය.

- සිව්වැනි කාණ්ඩය සඳහා මාතෘකාව
  **"සුවඳ මලින් මුනිඳු පුදමු "**



**ලිපිනය**
කොළඹ තරුණ බෞද්ධ සංගමය,
70, ඩී. එස්. සේනානායක මාවත,
කොළඹ - 08.
ශ්‍රී ලංකාව.

**සභාපති**
මහේන්ද්‍ර ජයසේකර
**උප සභාපතිවරු**
කුසුමබන්දු සමරවික්‍රම
නලින් ජේ. අබේසේකර
දයා වීරසේකර
සුනිල් එස්. සිරිසේන
ඩී. ගාමිණී විමලසූරිය

**ගරු ප්‍රධාන ලේකම්**
ප්‍රසන්න අබේකෝන්

**ගරු භාණ්ඩාගාරික**
රන්ජන් ද සිල්වා

**දුරකථන**
: 9411 2695598
: 9411 2682397
: 9411 2695786
: 9411 2682398
: 9411 2698083
**ෆැක්ස්**
:9411 2682397

**විද්‍යුත් තැපැල**
info@colomboymba.com

**වෙබ් අඩවිය**
www.colomboymba.org

**මුහුණු පොත**
www.facebook.com/ymba.org

**ඉහත සඳහන් කාණ්ඩ 4 යටතේ පවත්වන අවසාන තරගය**

නියමිත දින වනවිට ඉදිරිපත් කර ඇති රචනා විනිසුරු මඬුල්ලක් මගින් පරීක්‍ෂා කර සෑම කාණ්ඩයකම ඉහළ ලකුණු ලැබූ 25 දෙනෙකු බැගින් බොරැල්ලේ පිහිටි කොළඹ තරුණ බෞද්ධ සංගම් ශාලාවේ පැවැත්වෙන අවසාන තරගය සඳහා කැඳවනු ලැබේ. එහිදී දෙන ලද මාතෘකාවක් යටතේ ගද්‍ය රචනාවක් හා පද්‍ය 3 ක නිර්මාණයක් කිරීමට අවස්ථාව සලසා දෙන අතර ඉන් පළමුවැනි, දෙවැනි, තුන්වැනි, සිව්වැනි හා පස්වැනි ස්ථාන සඳහා ජයග්‍රාහකයන් හෝ ජයග්‍රාහිකාවන් තෝරා ගනු ලැබේ.

**දිනය**

**සියලුම රචනා 2024 මාර්තු මස 22 දිනට පෙර මතු සඳහන් කර ඇති ලිපිනයට එවිය යුතුවේ.**

**ගද්‍ය පද්‍ය රචනා සඳහා ත්‍යාග ජය සංකේත සහ සහතික පත් හිමිවනුයේ පහත දක්වා ඇති ආකාරයටය.**

| | | | |
|---|---|---|---|
| පළමුවැනි කාණ්ඩය (කනිෂ්ඨ අංශය) | පළමු වන ස්ථානයට | - | ජය සංකේතයක් සමග මුදලින් රු. 10,000/- ක් හා සහතික පතක් ද |
| | දෙවන ස්ථානයට | - | මුදලින් රු. 7,500/- ක් හා සහතික පතක් ද |
| | තුන්වන ස්ථානයට | - | මුදලින් රු. 3,000/- ක් හා සහතික පතක් ද |
| | හතරවන ස්ථානයට | - | මුදලින් රු. 2,000/- ක් හා සහතික පතක් ද |
| | පස්වන ස්ථානයට | - | මුදලින් රු. 2,000/- ක් හා සහතික පතක් ද |
| දෙවැනි කාණ්ඩය (ජ්‍යෙෂ්ඨ අංශය) | පළමු වන ස්ථානයට | - | ජය සංකේතයක් සමග මුදලින් රු. 15,000/- ක් හා සහතික පතක් ද |
| | දෙවන ස්ථානයට | - | මුදලින් රු. 10,000/- ක් හා සහතික පතක් ද |
| | තුන්වන ස්ථානයට | - | මුදලින් රු. 7,500/- ක් හා සහතික පතක් ද |
| | හතරවන ස්ථානයට | - | මුදලින් රු. 5,000/- ක් හා සහතික පතක් ද |
| | පස්වන ස්ථානයට | - | මුදලින් රු. 3,000/- ක් හා සහතික පතක් ද |
| තෙවැනි කාණ්ඩය (ගුරුභවතුන් සඳහා) | පළමු වන ස්ථානයට | - | ජය සංකේතයක් සමග මුදලින් රු. 15,000/- ක් හා සහතික පතක් ද |
| | දෙවන ස්ථානයට | - | මුදලින් රු.10,000/- ක් හා සහතික පතක් ද |
| | තුන්වන ස්ථානයට | - | මුදලින් රු. 7,500/- ක් හා සහතික පතක් ද |
| | හතරවන ස්ථානයට | - | මුදලින් රු. 5,000/- ක් හා සහතික පතක් ද |
| | පස්වන ස්ථානයට | - | මුදලින් රු. 3,000/- ක් හා සහතික පතක් ද |
| සිව්වැනි කාණ්ඩය (පද්‍ය රචනා) | පළමු වන ස්ථානයට | - | ජය සංකේතයක් සමග මුදලින් රු. 15,000/- ක් හා සහතික පතක් ද |
| | දෙවන ස්ථානයට | - | මුදලින් රු. 10,000/- ක් හා සහතික පතක් ද |
| | තුන්වන ස්ථානයට | - | මුදලින් රු. 7,500/- ක් හා සහතික පතක් ද |
| | හතරවන ස්ථානයට | - | මුදලින් රු. 5,000/- ක් හා සහතික පතක් ද |
| | පස්වන ස්ථානයට | - | මුදලින් රු. 3,000/- ක් හා සහතික පතක් ද |

**ගද්‍ය රචනා කාණ්ඩ තුනෙන් අත් අකුරු (විධිමත්ව පැහැදිලිව) ලියන ලද තරගකරුට හෝ තරගකාරියට මුදලින් රු. 5,000/- ක් ද සහතික පතක් ද තිළිණ කරනු ලැබේ. මෙම ගද්‍ය පද්‍ය ගායනා තරගාවලියේ විශිෂ්ටයින්ගේ විශිෂ්ටතමයා සඳහා බුදු සරණ පුවත්පතින් පිරිනමනු ලබන රිදී කුසලානය ප්‍රදානය කෙරේ.**

❖ ගද්‍ය පද්‍ය රචනා සමග **(ගද්‍ය රචනා සහ පද්‍ය රචනා සඳහා වෙන වෙනම අයදුම්පත් පුරවා එවන්න.)** පහත සඳහන් විස්තර සනාථ කර අමුණා තිබිය යුතුයි.

1. අයදුම්කරුගේ නම : ..............................................................................................................
2. ලිපිනය : ...........................................................................................................................

   ........................................................ දිස්ත්‍රික්කය-: ...........................................................................
3. 2024.01.01 දිනට වයස : අවු ................ මාස ............. දුරකථන අංකය : (WhatsApp) ...................................................
4. අයදුම්කරු අධ්‍යාපනය ලබන දහම් පාසලේ / පාසලේ නම සහ ලිපිනය : - ..........................................................

   ..............................................................................................................................................
5. අයදුම්කරු ඉගැන්වීමේ යෙදී සිටින දහම් පාසලේ නම සහ ලිපිනය: .......................................................................

   ..............................................................................................................................................
6. ගද්‍ය රචනයේ / පද්‍ය රචනයේ මාතෘකාව : ...........................................................................................
7. මෙම රචනය / පද්‍ය පංතිය අදාළ අයදුම්කරුගේ ස්වාධීන නිබන්ධනයක් බවට සහතික කරමි.

.......................................................................

විදුහල්පති / දහම් පාසලේ ප්‍රධානාචාර්ය

## ගද්‍ය - පද්‍ය ගායනා තරගය

සමස්ත ලංකා ගද්‍ය - පද්‍ය ගායනා තරගය කාණ්ඩ දෙකකින් පැවැත්වේ. සෑම තරගකරුවෙක් හා තරගකාරියක්ම ගද්‍ය පද්‍ය තරග දෙකටම සහභාගී විය යුතුය.

පළමු කාණ්ඩය - කනිෂ්ඨ තරගය වයස අවුරුදු 12 - 15 අතර දරු දැරියන් සඳහා
දෙවන කාණ්ඩය - ජ්‍යෙෂ්ඨ තරගය සඳහා වයස අවුරුදු 15 - 19 අතර දරු දැරියන් සඳහා

ඉහත කාණ්ඩ සඳහා ප්‍රාථමික තරග දිස්ත්‍රික්ක මට්ටමින් පවත්වා එහි පළමුවන, දෙවන හා තෙවන ස්ථාන දිනා ගන්නා ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් සඳහා අවසාන තරගය කොළඹ තරුණ බෞද්ධ සංගම් ශාලාවේ දී පසුව සඳහන් කරන දිනයක දී පැවැත්වේ.

දිස්ත්‍රික්ක මට්ටමේ තරගාවලියේ පළමු වන, දෙවන හා තෙවන ස්ථාන ලබා ගන්නා ජයග්‍රාහකයින්ට සහතික පත් ප්‍රදානය කරනු ලැබේ.

## ගද්‍ය කියවීමේ තරගය සඳහා නියමිත පොත්

පූජාවලිය, බුත්සරණ, අමාවතුර, සද්ධර්මරත්නාවලිය, දළදා සිරිත, කුවේණි අස්න, සකස්කට, ජාතක පොත අතුරින් තෝරාගත් එක් පොතකින් වචන 50 - 60 අතර ගද්‍ය කොටසක් කට පාඩමින් ගායනා කළ යුතුය.

## පද්‍ය ගායනා තරගය සඳහා නියමිත පොත්

සුභාෂිතය, බුදුගුණ අලංකාරය, ගුත්තිල කාව්‍යය, ගංගා රෝහණ වර්ණනාව, යශෝධරාවත, ලෝවැඩ සඟරාව යන පොත් වලින් තෝරාගත් පොත් තුනකින් මාත්‍රා 16 - 18 ත් හෝ 26 ත් අතර පැදි 3 ක් කට පාඩමින් ගායනා කළ යුතුය.

## ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග පිරිනැමීම

**පළමු කාණ්ඩයේ (කනිෂ්ඨ)** -
ප්‍රථම ස්ථානය සඳහා ජය සංකේතය සමග මුදලින් රු. 15,000/- ක් හා සහතික පතක්
දෙවන ස්ථානය සඳහා මුදලින් රු. 10,000/- ක් හා සහතික පතක් ද
තෙවන ස්ථානය සඳහා මුදලින් රු. 7,500/- ක් හා සහතික පතක් ද
හතරවන ස්ථානය සඳහා මුදලින් රු. 5,000/- ක් හා සහතික පතක් ද
පස්වන ස්ථානය සඳහා මුදලින් රු. 3,000/- ක් හා සහතික පතක් ද

**දෙවන කාණ්ඩයේ (ජ්‍යෙෂ්ඨ)** -
ප්‍රථම ස්ථානය සඳහා ජය සංකේතය සමග මුදලින් රු. 15,000/- ක් හා සහතික පතක්
දෙවන ස්ථානය සඳහා මුදලින් රු. 10,000/- ක් හා සහතික පතක් ද
තෙවන ස්ථානය සඳහා මුදලින් රු. 7,500/- ක් හා සහතික පතක් ද
හතරවන ස්ථානය සඳහා මුදලින් රු. 5,000/- ක් හා සහතික පතක් ද
පස්වන ස්ථානය සඳහා මුදලින් රු. 3,000/- ක් හා සහතික පතක් ද

**නියමිත ඉල්ලුම් පත්‍රය පුරවා 2024 මාර්තු 22 ට පෙර පහත සඳහන් ලිපිනයට එවිය යුතුවේ.**

**ආචාර්ය පද්මසිරි රණවකආරච්චි,
සිංහල සාහිත්‍ය කමිටු ලේකම්,
කොළඹ තරුණ බෞද්ධ සංගමය,
70, ඩී. එස්. සේනානායක මාවත,
බොරැල්ල - කොළඹ - 08.**

## **ගද්‍ය - පද්‍ය ගායනා තරගය - 2024 වසර සඳහා අයදුම් පත**

(සෑම තරගකරුවෙකුම ගද්‍ය සහ පද්‍ය ගායනා දෙකටම ඉදිරිපත් විය යුතුය)

| **කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා** | **අනවශ්‍ය වචනය කපා හරින්න.** |
|---|---|
| තරග අංකය : - ........................................ | කනිෂ්ඨ / ජ්‍යෙෂ්ඨ |
| වේලාව : - .................................................... | |

අයදුම්කරුගේ සම්පූර්ණ නම : - ........................................................................................................................

උපන් දිනය : - ..................................... 2024.01.01 දිනට වයස අවු :- ........................ මාස :- ................................

පෞද්ගලික ලිපිනය :- ........................................................................................................................................

දුරකථන අංකය (WhatsApp) :- ..................................................

දහම් පාසලකින්, රජයේ පාසලකින් ඉදිරිපත් වන්නේ නම් එම පාසලේ නම සහ ලිපිනය :- .....................................

........................................................................................................................................................................

................................................................................................ ඊමේල් ලිපිනය ඇතොත් :- ............................................................

පදිංචි දිස්ත්‍රික්කය :- .........................................................

ගද්‍ය පාඨය සහ පද්‍ය තෝරා ගන්නා ග්‍රන්ථ :- .........................................................................................................

දුරකථන අංක (දහම් පාසලේ / පාසලේ) : ............................................................................................... ඔබ පදිංචි දිස්ත්‍රික්කයේ මෙම තරගය පැවැත්වීමට අවස්ථාවක් නොලැබුණහොත් පූර්ව තරග සඳහා ඔබට සහභාගි විය හැකි ආසන්න දිස්ත්‍රික්කය නම් කරන්න -: ....................................................................

අදාළ තොරතුරු නිවැරදි බව සහතික කරමි.

| ................................................................... | ................................................................... |
|---|---|
| දිනය | අයදුම්කරුගේ අත්සන |

මෙහි සඳහන් තොරතුරු මාගේ අවබෝධය අනුව සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

| ................................................................... | ................................................................... |
|---|---|
| දිනය | මව/පියා/භාරකරුගේ අත්සන |

| ................................................................... | ................................................................... |
|---|---|
| දිනය | විදුහල්පති අත්සන |

# කොළඹ තරුණ බෞද්ධ සංගමය මගින් පවත්වන සමස්ත ලංකා බෞද්ධ චිත්‍ර තරගය සහ කථික තරගය 2024

## චිත්‍ර තරගය

## සමස්ත ලංකා චිත්‍ර තරගය කාණ්ඩ දෙකකින් පැවැත්වේ.

පළමු කාණ්ඩය - කනිෂ්ඨ තරගය 01 ශ්‍රේණියේ සිට 05 ශ්‍රේණිය දක්වා දරු දැරියන් සඳහා
මාතෘකා - **"ගමේ පන්සලේ පෝදා අසිරිය"**

දෙවන කාණ්ඩය - ජ්‍යෙෂ්ඨ තරගය 06 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා දරු දැරියන් සඳහා

මාතෘකා **" නගරබද වෙසක් සිරි"**

**(ඉහත සඳහන් කාණ්ඩ දෙක සඳහාම ශ්‍රේණිය සඳහන් කිරීම අනිවාර්යවේ.)**

උපදෙස් - ඉහත සඳහන් මාතෘකාව යටතේ අඟල් 18 × 14 ප්‍රමාණයේ සුදු කොළයක අඳින ලද චිත්‍රයක් පැස්ටල් හෝ දියසායම් පමණක් භාවිතා කර නිර්මාණය කර එම චිත්‍රයේ අනෙක් පිටුවේ ප්‍රධානාචාර්ය හෝ විදුහල්පති තුමා විසින් සහතික කොට චිත්‍රයට හානියක් නොවන පරිදි **පසුපිටේ දක්වා ඇති පරිදි අයදුම් පත්‍රයක්** සම්පූර්ණ කර ඊට අමුණා කොළඹ තරුණ බෞද්ධ සංගමයට තැපැල් මගින් හෝ ගෙනවිත් භාරදිය යුතුය.

## අවසාන මහා තරගය

නියමිත දින වන විට ඉදිරිපත් කර ඇති චිත්‍ර විනිසුරු මඬුල්ලක් මගින් පරීක්ෂා කර ඉහළ ලකුණු ලැබූ 25 දෙනෙකු බැගින් කොළඹ තරුණ බෞද්ධ සංගම් ශාලාවේ පැවැත්වෙන අවසාන මහා තරගය සඳහා කැඳවනු ලැබේ. ඉන් පළමු වැනි, දෙවැනි, තෙවැනි, සිව්වැනි හා පස්වැනි ස්ථාන සඳහා ජයග්‍රාහකයන් හෝ ජයග්‍රාහිකාවන් තෝරා ගනු ලැබේ.

## ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග පිරිනැමීම

| | | | |
|---|---|---|---|
| පළමු වැනි කාණ්ඩයේ | පළමු වැනි ස්ථානයට | - | මුදලින් රු. 15,000/- ක් හා සහතික පතක් ද |
| | දෙවැනි ස්ථානයට | - | මුදලින් රු. 7,500/- ක් හා සහතික පතක් ද |
| | තුන්වැනි ස්ථානයට | - | මුදලින් රු. 5,000/- ක් හා සහතික පතක් ද |
| | හතරවැනි ස්ථානයට | - | මුදලින් රු. 3,000/- ක් හා සහතික පතක් ද |
| | පස්වැනි ස්ථානයට | - | මුදලින් රු. 2,500/- ක් හා සහතික පතක් ද |
| දෙවැනි කාණ්ඩයේ | පළමු වැනි ස්ථානයට | - | මුදලින් රු. 20,000/- ක් හා සහතික පතක් ද |
| | දෙවැනි ස්ථානයට | - | මුදලින් රු. 10,000/- ක් හා සහතික පතක් ද |
| | තුන්වැනි ස්ථානයට | - | මුදලින් රු. 7,500/- ක් හා සහතික පතක් ද |
| | හතරවැනි ස්ථානයට | - | මුදලින් රු. 5,000/- ක් හා සහතික පතක් ද |
| | පස්වැනි ස්ථානයට | - | මුදලින් රු. 3,000/- ක් හා සහතික පතක් ද |

**(මේ සඳහා අවශ්‍ය ආදර්ශ අයදුම්පත පසුපිටේ දක්වා ඇත.)**

## සමස්ත ලංකා දීප ව්‍යාප්ත කථික තරගය - 2024

පළමු කාණ්ඩය - කනිෂ්ඨ තරගය වයස අවුරුදු 12 - 15 අතර දරු දැරියන් සඳහා
දෙවන කාණ්ඩය - ජ්‍යෙෂ්ඨ තරගය වයස අවුරුදු 15 - 19 අතර දරු දැරියන් සඳහා
} **කාලය විනාඩි 03 කි**

මාතෘකාව - **"125 වසරක් සපිරුනු කොළඹ තරුණ බෞද්ධ සංගමය"**

ඉහත කාණ්ඩ සඳහා වන ප්‍රාථමික තරග දිස්ත්‍රික්ක මට්ටමින් පවත්වා එහි පළමුවන, දෙවන හා තෙවන ස්ථාන දිනා ගන්නා ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් සඳහා අවසාන තරගය බොරැල්ලේ පිහිටි කොළඹ තරුණ බෞද්ධ සංගම් මූලස්ථානයේදී මතු සඳහන් කරන දිනයක දී පැවැත්වේ.

දිස්ත්‍රික්ක මට්ටමේ තරගාවලියේ පළමු වන, දෙවන හා තෙවන ස්ථාන ලබා ගන්නා ජයග්‍රාහකයින්ට සහතික පත් ප්‍රදානය කරනු ලැබේ.

## **ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග පිරිනැමීම**

**පළමු කාණ්ඩයේ (කනිෂ්ඨ)** - ප්‍රථම ස්ථානය සඳහා මුදලින් රු. 15,000/- ක් හා සහතික පතක්
දෙවැනි ස්ථානය සඳහා මුදලින් රු. 10,000/- ක් හා සහතික පතක් ද
තෙවැනි ස්ථානය සඳහා මුදලින් රු. 7,500/- ක් හා සහතික පතක් ද
හතරවැනි ස්ථානය සඳහා මුදලින් රු. 5,000/- ක් හා සහතික පතක් ද
පස්වැනි ස්ථානය සඳහා මුදලින් රු. 3,000/- ක් හා සහතික පතක් ද

**දෙවන කාණ්ඩයේ (ජ්‍යෙෂ්ඨ)** - ප්‍රථම ස්ථානය සඳහා මුදලින් රු. 20,000/- ක් හා සහතික පතක්
දෙවැනි ස්ථානය සඳහා මුදලින් රු. 10,000/- ක් හා සහතික පතක් ද
තෙවැනි ස්ථානය සඳහා මුදලින් රු. 7,500/- ක් හා සහතික පතක් ද
හතරවැනි ස්ථානය සඳහා මුදලින් රු. 5,000/- ක් හා සහතික පතක් ද
පස්වැනි ස්ථානය සඳහා මුදලින් රු. 3,000/- ක් හා සහතික පතක් ද

අයදුම්පත් පිරවීම සඳහා උපදෙස්

- **චිත්‍ර තරගය සඳහා ඉදිරිපත් වන අයවලුන් තම විදුහල්පතිතුමා/ප්‍රධානාචාර්ය තුමා සහතික කරනු ලැබූ චිත්‍රය සමග ඔබ විසින් සකස් කර ගන්නා ලද පහත සඳහන් අයදුම්පත 2024 මාර්තු 22 වෙනි දිනට පෙර එවිය යුතුයි.**

- **කථික තරග සඳහා ඉදිරිපත් වන අයවලුන් පිටපත් කරගත් මෙම අයදුම්පත්‍රය සම්පූර්ණ කර පහත දක්වා ඇති ලිපිනයට 2024 මාර්තු 22 වැනි දිනට පෙර එවිය යුතුය.**

### **චිත්‍ර තරගය සහ කථික තරගය සඳහා ඉදිරිපත්වන අයදුම්කරුවන් සඳහා වූ ආදර්ශ අයදුම්පත - 2024**

**චිත්‍ර සඳහා තෝරාගත් නම :- ..........................................................................**

1. අයදුම්කරුගේ/කාරියගේ නම : ..........................................................................................................

2. ලිපිනය : ..........................................................................................................................

3. දිස්ත්‍රික්කය-: ................................................. දුරකථන අංකය :(WhatsApp) ..........................................

4. උපන් දිනය : ........................................ 2024.01.01 දිනට වයස අවු : .............................. මාස : ..............................

5. අයදුම්කරු අධ්‍යාපනය ලබන දහම් පාසලේ / පාසලේ නම සහ ලිපිනය : - ..........................................................

   ..........................................................................ඉගෙනුම ලබන ශ්‍රේණිය : ..............................

6. අයදුම්කරුගේ අත්සන :- ................................................ ඊමේල් ලිපිනය ඇතොත් :- ..............................................

7. මෙම චිත්‍රය අදළ අයදුම්කරුගේ ස්වාධීන නිර්මාණයක් බවට සහතික කරමි. (කථික තරගය සඳහා ඉදිරිපත්වන අයවලුන්ට මෙම වගන්තිය අදළ නොවේ.)

..........................................................................

අයදුම්පත්/නිර්මාණ ඉදිරිපත් කළ යුතු ලිපිනය — විදුහල්පති / දහම් පාසලේ ප්‍රධානාචාර්ය

**ආචාර්ය පද්මසිරි රණවකආරච්චි ,**

**සිංහල සාහිත්‍ය කමිටු ලේකම්,**
**කොළඹ තරුණ බෞද්ධ සංගමය,**
**70, ඩී. එස්. සේනානායක මාවත,**
**බොරැල්ල - කොළඹ - 08.**